ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/4/12

2025 පෙබරවාරි මස 12වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,**

**නව රජයේ අමාත්‍යවරුන්ගේ කාර්යයන් සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා වන උපදෙස්**

ඉහත කරුණ සම්බන්ධයෙන් මගේ අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/12 හා 2025 ජනවාරි මස 21 දිනැති චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීමේ දී මතුවන ප්‍රායෝගික තත්ත්වයන් පිළිබඳව කරන ලද විමසීම් අනුව, පහත වැඩිදුර පැහැදිලි කිරීම් සිදු කෙරේ.

1. සහාය කාර්ය මණ්ඩලයේ සිටින නිල වාහනයකට හිමිකම් ලබන නිලධාරීන් සඳහා වාහන හිමිකම් සහිත රජයේ නිලධාරීන්ට වාහන ලබාදීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙතට සමානව රියදුරෙකු ද සමග වාහනය ලබා දිය යුතුය. එසේ රියදුරන් ලබා දීමට ප්‍රමාණවත් රියදුරන් අමාත්‍යාංශය සතුව නොමැති නම්, එම අවස්ථාවල දී එම චක්‍රලේඛයෙහි 2.10 ඡේදය පරිදි කටයුතු කළ හැකිය.

2. එම චක්‍රලේඛයේ අංක 2.7 හා 2.8 ඡේද, 2.1 වගන්තිය මගින් දක්වා ඇති අමාත්‍යවරුන්ගේ/නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහය කාර්ය මණ්ඩලය සඳහා අදාළ විය යුතුය.

3. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩල වලින් අමාත්‍යවරුන්ගේ/නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය සඳහා අනුයුක්ත කළ යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016හි ඇමුණුම 01හි දක්වා ඇති ආයතන මඟින් පමණක් විය යුතුය. කිසියම් සුවිශේෂ කරුණක් හේතුවෙන් ඉහත චක්‍රලේඛයෙහි සඳහන් නොවන අනුයුක්ත කිරීම් වේ නම් ඒ සම්බන්ධයෙන් අදාළ ආයතනයන්හි කළමනාකාරීත්වයන් සමඟ සාකච්ඡා කර පත්වන එකඟතාවන්ට අනුව කටයුතු කිරීමට බාධාවක් නැත.

4. කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගන්නේ නම් ඔවුන්ට ගෙවිය යුතු වැටුප සම්බන්ධයෙන් තීරණය කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2018හි දක්වා ඇති "වැටුප" සම්බන්ධ අර්ථ නිරූපණය අනුව කටයුතු කළ යුතුය. තවද, අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය මණ්ඩලයට පත්වන සියලුම නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයට, රාජ්‍ය සේවයේ එම තනතුරුවලට අනුරූප පිරිස් සඳහා ගෙවනු ලබන සියලුම දීමනා සඳහා හිමිකම් ඇත.

5. චක්‍රලේඛයේ 2.1 කාර්ය මණ්ඩල සංයුතියේ 6 යටතේ දක්වා ඇති අමාත්‍යවරුන්ගේ/නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය කාර්ය මණ්ඩලයේ "කළමනාකරණ සහකාර" යන තනතුර "සංවර්ධන නිලධාරි/කළමනාකරණ සේවා නිලධාරි" ලෙස සංශෝධනය කෙරේ. එම තනතුරු සඳහා අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ දී තනතුරු නාමය මූලික සුදුසුකම් අනුව ලබා දිය යුතු

අතර එම කාර්ය මණ්ඩලයේ වැටුප, බඳවා ගනු ලබන තනතුරේ රාජ්‍ය සේවයට අදාළ මූලික වැටුප් පියවරට අනුරූප විය යුතුය.

6. චක්‍රලේඛයෙහි 3.4 ඡේදයට පසුව පහත ඡේදය 3.5 ලෙස ඇතුළත් විය යුතුය.
*"3. 5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි '2.4 පොදු විධිවිධාන' ඡේදයේ විධිවිධානයන්ට යටත්ව අමාත්‍යවරුන්/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට මෙන්ම නිල වාහන හිමිකම් ඇති පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා, නිල ගමන් සහ පෞද්ගලික ගමන් සඳහා රියදුරු නොමැති අවස්ථාවල වාහනය පැදවීමට අවසර දිය හැකිය"*

7. චක්‍රලේඛයෙහි 4.6 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කළ යුතු ය.
*"4. 6. ඉහත සඳහන් කර ඇති උපරිම සීමාව අනුව, අමාත්‍යවරුන්/නියෝජ්‍ය අමාත්‍යවරුන් හා දුරකථන සඳහා හිමිකම් කියන පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට හිමි දුරකථන දීමනාව වැටුපට එකතු කර ගෙවිය යුතු ය. කෙසේ වෙතත්, සියලු ම දුරකථන ගාස්තු එම සීමාව තුළ කළමනාකරණය කර ගත යුතුය."*

8. මේ පිළිබඳ ව තවදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම්, දුරකථන අංක 0114 354 354 (දිගු අංකය 3810) මඟින් හෝ 0773410575 මඟින්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (සංවර්ධන පරිපාලන) සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

ආචාර්ය එන්.එස්. කුමානායක
ජනාධිපති ලේකම්

පිටපත් :

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
4. ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
5. විගණකාධිපති